*Journal of Sri Lanka Library Review, Volume 38, Issue 2, June 2024, 31-49*
*DOI: https://doi.org/10.4038/sllr.v38i2.71*

# ඩිවී දශම වර්ගීකරණයෙහි 21, 22 හා 23 වන සංස්කරණ පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

# A Comparative Study of the 21st, 22nd, and 23rd Editions of the Dewey Decimal Classification.

**Demunnewe Upali Thero[1], M.G.H.K. Wijerathne[2]**

**Abstract**

Studying the history of library classification makes it clear that attempts have been made to classify the knowledge in the universe in some way for various reasons. A library classification is a formal method or system provided based on a numbering system so that readers of a library can easily and efficiently reach the library materials or knowledge materials they need through access to the classification number. Accordingly, several major library classification systems have emerged so far. Dewey Decimal Classification (DDC) System can be introduced as an excellent classification system among those classification systems. From time to time, several editions of the DDC appeared for different purposes. Meanwhile, its 23rd edition can be identified as the most widely used latest edition. This article provides a brief study of the changes and new trends between the 21st, 22nd, and 23rd editions of the DDC System.

**Keywords:** Bibliographic control, Classification, Classification policy, Dewey Decimal Classification, Library classification, Organization of knowledge

---

[1]Probationary Lecturer, Department of Social Sciences and Comparative Studies, Bhiksu University of Sri Lanka
Email: upalithero@busl.ac.lk https://orcid.org/0009-0001-2188-3936

[2]Assistant Librarian, Sri Lanka Law College
Email: erandakaushalya1@gmail.com https://orcid.org/0009-0000-5119-4763

Received: 12 January 2024, Accepted revised version: 15 June 2024
This work is licensed under a Creative Commons Attribution-ShareAlike 4.0 International License.

**සංක්ෂේපය**

විශ්වයේ පවතින දැනුම කිසියම් ආකාරයකින් ඒ ඒ හේතූන් මත වර්ගීකරණයකට ලක් කිරීමට ප්‍රයත්න දරා ඇති බව පුස්තකාල වර්ගීකරණ ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් මනාව පැහැදිලි වේ. පුස්තකාලයක පාඨකයන්ට, ඔවුන්ට අවශ්‍ය පුස්තකාල ද්‍රව්‍ය හෙවත් දැනුම් ද්‍රව්‍ය වෙත ඉතා පහසුවෙන් හා කාර්යක්ෂමව වර්ග අංක ප්‍රවේශය තුළින් ලඟා වීමට හැකි වන අයුරින්, අංකනය මත පදනම්ව සපයා ඇති/සපයනු ලබන විධිමත් ක්‍රමවේදය හෝ පද්ධතිය (System) පුස්තකාල වර්ගීකරණය (Library Classification) යනුවෙන් හැඳින්වේ. ඒ අනුව මේ දක්වා ප්‍රධාන පුස්තකාල වර්ගීකරණ පද්ධති කිහිපයක්ම බිහි වී ඇති බව දැකගත හැකිය. එකී වර්ගීකරණ පද්ධති අතරින් විශිෂ්ට වර්ගීකරණ පද්ධතියක් ලෙස ඩිවී දශම වර්ගීකරණ පද්ධතිය හඳුන්වා දිය හැකිය. වරින් වර විවිධ අරමුණු නිසාවෙන් ඩිවී දශම වර්ගීකරණයෙහි සංස්කරණ ගණනාවක් බිහි විය. ඒ අතර එහි 23 වන සංස්කරණය මේ වන විට බහුලව භාවිත වන නවතම සංස්කරණය ලෙස හඳුනාගත හැකිය. 21, 22 හා 23 වන සංස්කරණය අතර සිදුව ඇති වෙනස්කම් හා නව ප්‍රවණතා පිළිබඳව සංක්ෂිප්ත අධ්‍යයනයක් මෙම ලිපිය මගින් සිදු කොට ඇත.

**මුඛ්‍යපද:** ග්‍රන්ථ විඥාපන පාලනය, ඩිවී දශම වර්ගීකරණය, දැනුම සංවිධානය, පුස්තකාල වර්ගීකරණය, වර්ගීකරණ ප්‍රතිපත්ති, වර්ගීකරණය

## හැඳින්වීම

විශ්වයේ පවතින දැනුම සමාරම්භයේ සිටම මානව ක්‍රියාකාරකම් හා පර්යේෂණාත්මක අධ්‍යයනයන්හි ප්‍රතිඵලයක් වශයෙන් විවිධ ශානරයන් යටතේ වර්ධනය වී ඇත. දාර්ශනික ගුරුකුල හා අන්තේවාසික අධ්‍යයනයන් නිසා බුද්ධිය හා දැනුම මෙහෙයවා නිර්මිත බුද්ධිමය දේපළ හෙවත් මිනිස් චින්තනයෙන් පහළ වූ විශ්ව දැනුම ද කිසියම් ආකාරයකින් ඒ ඒ හේතූන් මත වර්ගීකරණයකට ලක් කිරීමට ප්‍රයත්න දරා ඇත. නූතන අර්ථයෙන් සිංහල භාෂාවේ භාවිත වර්ගීකරණය යන පාරිභාෂික වචනය ලතින්, ග්‍රීක හා ඉංග්‍රීසි භාෂාවලින් ඝණීකරණය වී පුස්තකාල හා විඥාපන විද්‍යාවේ භාවිත වේ. Classification යන්න Classi යන ලතින් භාෂාමය වචනයෙන් බිඳගත් වචනයකි. මෙහි Classi යනුවෙන් අර්ථ ගැන්වෙනුයේ විශේෂ ගුණ ඇති පුද්ගලයින්, ද්‍රව්‍ය හෝ සංකල්ප සමූහයක් අතුරින් යම් යම් සමාන ලක්ෂණ ඇති දෑ එක් කිරීමත්, අසමාන ලක්ෂණ ඇති දෑ වෙන් කිරීමත්ය. "It is the

identification of similarities and differences enabling one to group together things which are similar and separate them from things which are dissimilar" (Harrison & Beenham, 1985) යන නිර්වචනයෙන් ද එම අර්ථයම ස්ඵුට වේ. " වර්ග" යන්නට ශ්‍රී සුමංගල ශබ්දකෝෂය (සෝරත හිමි, 2011) සපයා ඇති අර්ථය වන්නේ සමාන ජාතික වූ සමූහය යන්නයි.

පුස්තකාලයක පාඨකයන්ට, අවශ්‍ය පුස්තකාලය ද්‍රව්‍ය හෙවත් දැනුම් ද්‍රව්‍ය වෙත ඉතා පහසුවෙන් හා කාර්යක්ෂමව ලඟා වීමට හැකි වන අයුරින්, යම් පුස්තකාලයක් විසින් සපයනු ලබන විධිමත් ක්‍රමවේදය හෝ පද්ධතිය (System) පුස්තකාල වර්ගීකරණය (Library Classification) යනුවෙන් හැඳින්වේ. පුස්තකාලයක පොතපත සොයා එන පාඨකයින්ට එම පොත්පත් සහ ඒවායෙහි අඩංගු කරුණු වඩාත් ප්‍රයෝජනවත් අයුරින් සොයා ගැනීම සඳහා දැනුම් ද්‍රව්‍ය රාක්කගත කිරීමේ ක්‍රමයක් වශයෙන් සේයර්ස් (Sayers) විසින් වර්ගීකරණය හඳුන්වන ලදි (Sayers, 1922). එකී විධිමත් වර්ගීකරණ ක්‍රමවේදයකට අනුව ඒ ඒ දැනුම් ද්‍රව්‍යයන් සඳහා වෙන වෙනම විද්‍යාත්මක සංකේතයක් නිර්මාණය කිරීම පුස්තකාල වර්ගීකරණය මගින් සිදු කරනු ලබයි. එම සංකේත මාර්ගයෙන් ඥාති විෂයන් එක් ස්ථානයකට එක්රැස් කරනු ලබයි. වර්ග අංකය හා ග්‍රන්ථ අංකය එකතුව සෑදෙන ඇමතුම් අංකය මගින් ඒ ඒ අයිතමවලට පාඨකයාට ප්‍රවේශ විය හැකිය. ඒ අනුව දැනුම අඩංගු සෑම අයිතමයකටම (Item) පුස්තකාලය තුළ විද්‍යානුකූල වූ නිශ්චිත ස්ථානයක් හිමි වන අතර එය පාඨකයාගේ තොරතුරු ගවේෂණය පහසු කරවනු ලබයි.

අතීතයේ සිට දැනුම කිසියම් ආකාරයකින් ඒ ඒ හේතූන් මත වර්ගීකරණයකට ලක් කිරීමට ප්‍රයත්න දරා ඇති බව ඉහත නිර්වචන හා පුස්තකාල වර්ගීකරණ ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. ඒ අනුව වර්ගීකරණය සඳහා වර්ගීකරණ පද්ධති කිහිපයක්ම බිහි වී ඇති බව පුස්තකාල වර්ගීකරණය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. එකී වර්ගීකරණයන්ගේ ප්‍රධාන කාර්යය වනුයේ සමාන ලක්ෂණ ඇති දැනුම් ද්‍රව්‍ය එක් තැන් කිරීමත් අසමාන ලක්ෂණ ඇති දැනුම් ද්‍රව්‍යය වෙන් කිරීමත්ය. මේ සඳහා උපයෝගී කරනු ලබන මිනුම් දඬු ලෙස විභේදකය දැක්විය හැකිය. විභේදක ලක්ෂණ උපයෝගී කරගෙන ලෝකයේ පවත්නා ඕනෑම දෙයක් වර්ගීකරණය කළ හැකි බව පුස්තකාලවේදීහු පෙන්වා දෙති.

මෙල්විල් ලුවිස් කොසුත් ඩිවි (Melvil Louis Kossuth Dewey) අනුව වර්ගීකරණය යනු **ඥාති විෂයන් එක්තැන් කිරීමේ ක්‍රියාවලිය** වන අතර ඒ සඳහා ආවේනික ලක්ෂණ සැලකිල්ලට ගනියි. එම ආවේනික ලක්ෂණ හෙවත් විභේදක භාවිතය එහි දී පාදක කර ගනු ලැබේ. කිසියම් ද්‍රව්‍ය සමූහයක නැතහොත් සංගහණයක දක්නට ඇති ගුණාංග හෝ ගති ලක්ෂණ සැලකිල්ලට ගෙන ඒවායේ වෙනස්කම්වලට අනුව වර්ග කිහිපයකට බෙදා යළි සංවිධානය කිරීම මෙයින් සරලව අදහස් කෙරේ. වගු අංක 01ට අනුව මේ සඳහා උපයෝගී කර ගනු ලබන ගුණාංග හෙවත් ලක්ෂණ භේදක ලක්ෂණ (තිස්ස, 2019) ලෙස හඳුන්වයි.

වගු අංක 01: භේදක ලක්ෂණ භාවිතය

| **සමූහය/සංගහණය** | **විභේදකය/භේදක ලක්ෂණ** | **ලැබෙන වර්ග** |
|---|---|---|
| 1. සාහිත්‍යය | භූගෝලීය ප්‍රදේශය (රට) | සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ප්‍රංශ, ඉතාලි |
| 2. නිවසක ඇති කාමර | ඉටුකෙරෙන කාර්යය | නිදන, කෑම පිසින, ගබඩා, විසිත්ත |
| 3. ඔසුහලක බෙහෙත් | රෝගයේ ස්වභාවය | රුධිර සංසරණ, ආහාර ජීර්ණ, අන්තරාසර්ග |
| 4. ජනතාව (මිනිස්සු) | ජීවත් වන ප්‍රදේශය | ඉන්දියාව, තායිලන්තය, ශ්‍රී ලංකාව |

**විභේදක යන වචනය සඳහා භේදක ලක්ෂණය යන ජනප්‍රිය වචනය පුස්තකාල හා විඥාපන විද්‍යා විෂයට අයත් පාරිභාෂික වචනයක් වශයෙන් ද හැඳින්වේ.** භේදක ලක්ෂණ (Characteristic of Division) සඳහා පාරිභාෂිකව විභේදක යන වචනය ද භාවිත වන බව එයින් අර්ථවත් වේ. එවැනි විභේදක ලෙස කරුණු අටක් (වීරසූරිය, 2014) දක්වා ඇත. ගුණය (Quality), ප්‍රමාණය (Quantity), බාහිර පෙනුම (External Appearance), අභ්‍යන්තර පෙනුම (Internal Features), පාරිසරික සාධක (Environmental Factors), භූගෝලීය කලාපීය සාධක (Geographical and Regional Factors), ගණිතමය සහ සංඛ්‍යාත්මක ප්‍රභේද (Mathematical and Statistical Factors), වෙනස් වීම සහ වෙනස් කිරීම (Change and Movement) යනාදිය පෙන්වා දී ඇත.

**පර්යේෂණ ගැටලුව**

ඩිවී දශම වර්ගීකරණය යනු ලෝකයෙහි බහුලව භාවිත වන පුස්තකාලය වර්ගීකරණ පද්ධතියකි. එකී ඩිවී දශම වර්ගීකරණයෙහි විවිධ සංස්කරණ වරින් වර බිහි වී ඇති බවක් දැකගත හැකිය. එසේ විවිධ සංස්කරණ බිහි වීමට බල පෑ හේතු කවරේද ? සහ එසේ බිහි වූ සංස්කරණ අතර සිදු වී ඇති වෙනස්කම් හා ප්‍රවණතා මොනවාද? යන්න විමර්ශනාතමකව අධ්‍යයනය මෙහි පර්යේෂණ ගැටලුවයි.

**පර්යේෂණ අරමුණු**

ඩිවී දශම වර්ගීකරණයෙහි 21, 22 හා 23 යන සංස්කරණ තුලනාත්මකව අධ්‍යයනය කිරීම හා එම සංස්කරණ අතර සිදුව ඇති වෙනස්කම් හඳුනා ගැනීම මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වේ. එසේම ඩිවී දශම වර්ගීකරණයෙහි ප්‍රවණතා අධ්‍යයනය කරමින් එහි අනාගත උපයෝගීතාව පිළිබඳ විමසා බැලීම ද මෙහි දී සිදු කරන ලදි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මෙම අධ්‍යයනය සිදු කෙරිණි. ඒ අනුව අදාළ මූලාශ්‍ර අධ්‍යයනය කරමින් ඩිවී දශම වර්ගීකරණයෙහි 21, 22 හා 23 සංස්කරණ පිළිබඳව ඇති පර්යේෂණ හා ශාස්ත්‍රීය සාහිත්‍යය විමර්ශනයට ලක් කරමින් දත්ත හා තොරතුරු සපයා ගෙන එම දත්ත ගුණාත්මක ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය කරමින් පර්යේෂණය සිදු කරන ලදි.

**සාකච්ඡාව**

දහනව වන සියවසේ ඇති වූ ප්‍රජාතන්තවාදී ස්වරූපයෙහි බලපෑමෙන් පුස්තකාල, පාඨකයාට විවෘත පොදු ස්ථානයක් බවට පත් විය. එහෙයින් පුස්තකාලයෙහි පැවතුණු දැනුම් ද්‍රව්‍යවලට විවෘත ප්‍රවේශයක් ඇති වීම හේතුවෙන් පොත් ගබඩා කිරීම, ස්ථානගත කිරීම, නැවත රාක්කගත කිරීම ආදි කටයුතු සඳහා විද්‍යාත්මක හා කාර්යක්ෂම ක්‍රමවේදයක් සම්පාදනය කර ගැනීමට තත්කාලීන පුස්තකාලවේදීන්ට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස පුස්තකාලය වර්ගීකරණ පද්ධති බිහි විය. දහනව වන සියවසේ අපර භාගය වන විට එතෙක් පැවති පුස්තකාලය වර්ගීකරණ ක්‍රමවල (උදා:- ස්ථිර ස්ථාපන ක්‍රම - Fixed Location Systems) යම් දුර්වලතා පැවතීම හේතුවෙන් ඒවා සංවර්ධනය කිරීමට පුස්තකාලයවේදීන්ට සිදු විය.

1870 වර්ෂයේ දී ඇම්හර්ට්ස් විද්‍යාල පුස්තකාලයේ සහායකයකු ලෙස කටයුතු ඇරඹූ මෙල්විල් ඩිවී විසින් උක්ත වර්ගීකරණ ක්‍රම තුළ පැවති ගැටලුකාරී ස්වභාවය මගහරවමින් නව වර්ගීකරණ ක්‍රමයක් 1876 දී හඳුන්වා දෙන ලදි. එය "A classification and subject Index for cataloguing and arranging the books and pamphlets of a library" යන නමින් නිර්නාමිකව ප්‍රකාශයට පත් කොට ඇත. ඉන්දු - අරාබි ඉලක්කම් හා දශම තිත භාවිත කරමින් සරල අංකන ක්‍රමයකට අනුව දැනුම් ද්‍රව්‍යවලට වර්ග අංක සැපයීමට සමත් වූ මෙම වර්ගීකරණ ක්‍රමය තත්කාලීන පුස්තකාලයවල සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නට විය. 1885 දී එහි දෙවන සංස්කරණයක් ද නිර්මාණය විය. ඒ මෙල්විල් ඩිවී හා ඩබ්ලිව්. එස්. බිස්කෝ විසිනි. එම සංස්කරණය "දශම වර්ගීකරණය හා සාපේක්ෂ අනුක්‍රමණිකාව" (Decimal Classification and Relative Index) යනුවෙන් හැඳින්වේ. මේ අනුව නිරන්තරයෙන් විවිධ අරමුණු නිසාවෙන් ඩිවී දශම වර්ගීකරණයෙහි සංස්කරණ ගණනාවක් බිහි වන්නට විය. ඒ අතර ඩිවී දශම වර්ගීකරණ පද්ධතියෙහි 23 වන සංස්කරණය මේ වන විට භාවිත නවතම සංස්කරණය ලෙස හඳුනාගත හැකිය.

## ඩිවී දශම වර්ගීකරණයෙහි 21 වන සංස්කරණය (1996)

ඔහියෝ හි ඩබ්ලින් නුවර Online Computer Library Center - OCLC විසින් 1988 දී ඩිවී දශම වර්ගීකරණයට සංස්කරණ දායකත්වය සැපයූ Forest Press නම් ආයතනය අයත් කර ගන්නා ලදි. මෙම ආයතන දෙකෙහි සුසංයෝගයෙන් බිහි වූ 20 වන සංස්කරණය නිසාවෙන් ඩිවී දශම වර්ගීකරණයෙහි ප්‍රවණතා රැසක් සිදු විය. ඒ අනුව ලොව බහුල ලෙස භාවිත වන ඥාන සංවිධාන පද්ධතිය ලෙසට ඩිවී දශම වර්ගීකරණය සංවර්ධනය කරන්නට එම ආයතන දෙකට හැකි විය. 1993 දී ඩිවී දශම වර්ගීකරණය Electronic Dewey යන නමින් සංයුක්ත තැටියක් ලෙසින් ප්‍රකාශයට පත් වීම (රණසිංහ, 2011) එහි කැපී පෙනෙන සන්ධිස්ථානයකි.

1992 දශම වර්ගීකරණ සංස්කාරක ප්‍රතිපත්ති කමිටුවේ (Decimal Classification Editorial Policy Committee -DCEPC) සභාපති වශයෙන් කටයුතු කළ Joan S. Mitchell ගේ සංස්කාරකත්වය යටතේ 1996 දී ඩිවී දශම වර්ගීකරණයෙහි 21 වන සංස්කරණය බිහි විය. සංයුක්ත තැටියක ස්වරූපයෙන් ප්‍රකාශයට පත් කළ එය පසුව Dewey for Windows (DfW) යනුවෙන් නම් කොට ඇත. පසුව www.oclc.org

වෙබ් පිටුව හරහා ද ප්‍රකාශයට පත් කරන ලදි. පෙර සංස්කරණවල දී සැලකිල්ලට ගත් "සරලතාව ඇති කිරීමේ ක්‍රියාවලිය" එලෙසින්ම ක්‍රියාත්මක කළ මෙම 21 වන සංස්කරණය තුළ ප්‍රධාන පරමාර්ථ දෙකක් පැවතුණි. එනම්,

01. නව මාතෘකා සඳහා අංක සැපයීම
02. විෂය ක්ෂේත්‍රයන්හි දැකිය හැකි නව ප්‍රවණතා විදහා දැක්විය හැකි පරිදි හා පක්ෂපාතිත්වය අවම කර ගැනීම සඳහා පවතින උපලේඛන (රණසිංහ, 2011) ප්‍රතිසංශෝධනය කිරීම යන්නයි. එම අරමුණු සාක්ෂාත් කරගනිමින් කරන ලද මෙම සංස්කරණය මතු සඳහන් කෙරෙන අයුරින් වෙළුම් හතරකින් සමන්විත වේ.

**පළමු වන වෙළුම : හැඳින්වීම හා සහායක චක්‍ර**

1. 21 වන සංස්කරණයේ නව ලක්ෂණ, විශේෂ ලක්ෂණ හා සංශෝධන පිළිබඳ විස්තරය.
2. හැඳින්වීම: ඩිවී දශම වර්ගීකරණය හා එය භාවිත කරන පිළිවෙළ පිළිබඳ විස්තරය.
3. පාරිභාෂික වචන මාලාව: ඩිවී වර්ගීකරණයේ භාවිත කරනු ලබන යෙදුම් පිළිබඳ කෙටි නිර්වචන.
4. හැඳින්වීමට සහ පාරිභාෂික වචන මාලාවට අනුක්‍රමණිකාවක්.
5. සහායක වගු හෙවත් චක්‍ර.
6. ඩිවී දශම වර්ගීකරණයෙහි 20 වන හා 21 වන සංස්කරණ සංසන්දනය කිරීමේ ලැයිස්තුව.

**දෙවන වෙළුම (000-599 ) හා තෙවන වෙළුම (600-999)**

7. උපලේඛනය: 000-999 දක්වා දැනුම සංවිධානය

**සිව්වන වෙළුම: සාපේක්ෂ අනුක්‍රමණිකාව හා අත්පොත**

8. සාපේක්ෂ අනුක්‍රමණිකාව: ශික්ෂණ හා අකාරාදිව සකසන ලද විෂය ලැයිස්තුව.
9. නියමුව: දුෂ්කර අංශ වර්ගීකරණය සඳහා උපදෙස්, නව උපලේඛනය පිළිබඳ විස්තර සහ කොංග්‍රස් පුස්තකාලයේ දශම වර්ගීකරණ අංශයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර.

දස වසරකට අධික කාලයක් පුරාවට මෙම වර්ගීකරණය භාවිත කළ අයගේ ඉල්ලීම් හා අදාළ විෂය ක්ෂේත්‍රයන්ගේ නව අවශ්‍යතා මත ඩිවී දශම වර්ගීකරණයෙහි 21 වන සංස්කරණයෙහි 296 - යුදෙව් ආගම, 297 - ඉස්ලාම් ආගම, 350 - 354- රාජ්‍ය පරිපාලනය, 370- අධ්‍යාපනය, 560- 690 - ජීව විද්‍යාවන් යන වර්ග පංති මුළුමනින්ම පාහේ ප්‍රතිශෝධනයට ලක් කොට ඇති බවක් දැක ගත හැකිය. එසේම ක්‍රිස්තියානි ආගමට ඩිවී දශම වර්ගීකරණය තුළ තිබුණු පක්ෂපාතීත්වය අවම කරමින් එම ආගම වෙනුවෙන් 201-209 දක්වා වෙන් කොට තිබූ ප්‍රමිත උපබෙදුම් 230 යටතේ සංග්‍රහ කොට ඇති බව ද දැකගත හැකිය. 350 - 354 රාජ්‍ය පරිපාලනය පිළිබඳ වර්ග පංති ව්‍යුහයේ හා වචනවල පැවති ඇමෙරිකානු පක්ෂපාතිත්වය ද අවම කොට ඇති සෙයක් මෙහි දී දැක ගත හැකිය (පද්මසිරි, 2006).

පෙර පැවති සංස්කරණයට වඩා වෙනස්කම් රැසක් මෙම සංස්කරණයේ දී කර ඇත. පෙර සංස්කරණයෙහි පැවතියාට වඩා පිටු 150ක් මෙහි අනුක්‍රමණිකාවට එකතු කොට තිබීම, පද හා ශීර්ෂ වැඩි ප්‍රමාණයක් එක් කොට තිබීම, අත්පොතේ වූ සටහන් අනුක්‍රමණිකාවට ද ඇතුළත් කොට තිබීම, අනුක්‍රමණිකාවේ දී සියලුම ශීර්ෂ ඍජුව දක්වා තිබීම යනාදිය එම වෙනස්කම්වලින් කිහිපයකි. එහි ප්‍රමිතිගත බව වැඩි කරගනු වස් පුද්ගල නාම හා භූගෝලීය නාම දැක්වීමේ දී ඇංග්ලෝ ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහයෙහි දෙවන සංස්කරණය ඇසුරු කොට තිබීම තවත් එක් විශේෂත්වයකි.

### ඩිවී දශම වර්ගීකරණයෙහි 22 වන සංස්කරණය (2003)

ඩිවී දශම වර්ගීකරණයෙහි 22 වන සංස්කරණය 2003 සැප්තැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් වී ඇත. මෙහි ද වෙළුම් ගණන පෙර සංස්කරණයේ මෙන් හතරකි. නාමික වශයෙන් වෙනසක් දර්ශනය නොවේ. 1 වෙළුම - හැඳින්වීම, 2 වෙළුම - 000-599 උපලේඛන, 3 වෙළුම - 600-999 උපලේඛන හා 4 වෙළුම - අනුක්‍රමණිකාව හා අත්පොත යනුවෙනි. අලුතින් විෂය මාතෘකා ඇතුළත් කිරීම, අංක පුළුල් කිරීම් සහ සංශෝධනය කිරීම ආදි වශයෙන් විවිධ යාවත්කාලීන කිරීම් බොහෝමයක් සිදුකර ඇත. බොහෝ වර්ග පංතිවල වෙනස්කම් රැසක් මෙම සංස්කරණයේ දී සිදු කර ඇති බව දැක ගත හැකිය. පරිගණක විද්‍යාව, ආගම, සමාජ කණ්ඩායම් හා සංස්කෘතික ආයතන, නීතිය, ගණිතය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව හා සෞඛ්‍යය, ඉතිහාසය හා භූගෝල විද්‍යාව යන විෂයයන් තුළ සිදු කොට ඇති වෙනස්කම් ඒ සඳහා නිදසුන් ලෙස දැක්විය හැකිය.

පරිගණක ලෝකයේහි සිදු වූ සංවර්ධනයත් සමග 22 වන සංස්කරණයහි Computer science විෂයයට අදාළව 005.722-Character sites ,006.74-Markup language යනාදි වශයෙන් අලුතින් විෂය මාතෘකා ඇතුළත් කොට ඇත. මීට අමතරව 005.5 යටතේ පරිගණක විෂයට සම්බන්ධ බොහෝ විෂය ශීර්ෂ එකතු කොට ඇති බවක් දැකගත හැකිය. 305-306 තුළ දී නව්‍ය වශයෙන් සමාජ කණ්ඩායම් හා සංස්කෘතික ආයතන හඳුන්වා දී ඇත. එසේම 340-නීතිය විෂය පරාසය සඳහා ජාතීන්ගේ නීති, මානව හිමිකම්, අන්තර්රාජ්‍ය සංවිධාන, ආදි විෂය කොටස් වැඩි දියුණු කිරීමකින් යුක්තව දක්වා ඇත. රසායන විද්‍යා විෂය අංකය (543.1-.8) හි විශ්ලේෂණාත්මක රසායන විද්‍යාවේ විශේෂිත මෙවලම් සඳහා නව පැතිරුණු අවස්ථා සහිත අංක සපයා ඇති බව දැක ගත හැකිය. එසේම 21 වන සංස්කරණයේ දී 544 - ගුණාත්මක විශ්ලේෂණය, 545 - ප්‍රමාණාත්මක විශ්ලේෂණය, 547.3 කාබනික රසායන විද්‍යාව ලෙස දැක් වූ අංක 22 වන සංස්කරණයේ දී සම්පූර්ණ වශයෙන්ම පුරප්පාඩු ලෙස තබා ඇත (අලහකෝන්, 2014).

## ඩිවී දශම වර්ගීකරණයෙහි 23 වන සංස්කරණය

ඩිවී දශම වර්ගීකරණයේ 22 වන සංස්කරණයට වඩා බොහෝ සෙයින් සංශෝධන සහිතව 23 වන සංස්කරණය 2011 වර්ෂයේ දී ප්‍රකාශිතය. මෙය කෙටි කාලීන හා දිගු කාලීන යාවත්කාලීන කිරීම් ඇතුළත් කරමින් සංස්කරණය කරන ලද ඉතා වටිනා ප්‍රකාශනකි. එම යාවත්කාලීන කිරීම් මුද්‍රිත පිටපත් හරහා ද ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම 23 වන සංස්කරණයෙහි විශේෂ ලක්ෂණයකි. මේ අනුව ඩිවී දශම වර්ගීකරණයේ 22 වන සංස්කරණයට සාපේක්ෂව 23 වන සංස්කරණයහි ප්‍රධානතම වෙනස්වීම් කිහිපයක්ම සිදුව ඇති බවක් දැකිය හැකිය. ඒවා නම්, පළමුවැන්න, සැකැස්මේ වෙනස්කම්, දෙවැන්න, නව දත්ත නිරූපණය, තෙවැන්න, ස්ථානීය වෙනස්කම්, සිව්වැන්න, ආදේශනීය වෙනස්කම්, පස්වැන්න, චක්‍ර නොහොත් වගු යාවත්කාලීන කිරීම, හයවැන්න, උපලේඛනය යාවත්කාලීන කිරීම යනුවෙන් එම වෙනස්වීම් පෙළ ගැස්විය හැකිය (අලහකෝන්, 2017).

### සැකැස්මේ සිදුව ඇති වෙනස්කම්:

23 වන සංස්කරණයෙහි මූලික වෙනස් කම් කිහිපයක්ම සිදු කරන ලද බව එහි සංස්කාරකයන් විසින් දක්වා ඇත. ඩිවී දශම වර්ගීකරණයේ 23 වන සංස්කරණය ප්‍රධාන වෙළුම් හතරකින් සමන්විත වන අතර 22 වන සංස්කරණයට සාපේක්ෂව 23

වන සංස්කරණයේ සැකැස්මෙහි වෙනස්කම් කිහිපයක්ම සිදුව ඇත. එම වෙනස්කම් පිළිබඳව වගු අංක 02 ඇසුරෙන් තොරතුරු නිරාවරණය කෙරේ.

වගු අංක 02 : DDC හි 22 වන හා 23 වන සංස්කරණයන්හි සැකැස්ම

| **DDC හි 22 වන සංස්කරණයේ සැකැස්ම** | **DDC හි 23 වන සංස්කරණයේ සැකැස්ම** |
|---|---|
| **1 වෙළුම**<br>**A** : 22 වන සංස්කරණයෙහි නව ලක්ෂණ හා වෙනස්කම් පිළිබඳ කෙටි හැඳින්වීම<br>**B** : හැඳින්වීම (DDC පිළිබඳ විස්තරය හා එය භාවිත කරන අයුරු)<br>**C** : පාරිභාෂික ශබ්දමාලාව<br>**D** : හැඳින්වීම සහ පාරිභාෂික ශබ්දමාලාව සඳහා අනුක්‍රමණිකාව<br>**E** : අත්පොත<br>**F** : වගු<br>**G** : 21 සහ 22 වන සංස්කරණවල සංසන්දනාත්මක ලැයිස්තු (පුනස්ථාපන සහ භාවිතයෙන් ඉවත් කළ අංක නැවත භාවිත අංක) | **1 වෙළුම**<br>**1.** 23 වන සංස්කරණයෙහි නව ලක්ෂණ, විශේෂ ලක්ෂණ හා සංශෝධන පිළිබඳ කෙටි හැඳින්වීම<br>**2.** හැඳින්වීම (DDC පිළිබඳ විස්තරය හා එය භාවිත කරන අයුරු)<br>**3.** පාරිභාෂික ශබ්දමාලාව<br>**4.** හැඳින්වීම සහ පාරිභාෂික ශබ්දමාලාව සඳහා අනුක්‍රමණිකාව<br>**5.** වගු<br>**6.** 22 සහ 23 වන සංස්කරණවල සන්සන්දනාත්මක ලැයිස්තු (සෝවියට් දේශය, රාජ්‍ය පරිපාලනය, අධ්‍යාපනය සහ ජෛව විද්‍යා උපලේඛනවල කරන ලද වෙනස්කම් ප්‍රතිභාවිත අංකනය) |
| **2 වෙළුම**<br>**H** : DDC සාරාංශ (පළමු, දෙවන හා තෙවන සාරාංශ)<br>**I** : අනුසූචිය (000-599 දක්වා උපලේඛනය)<br>**3 වෙළුම**<br>**J** : අනුසූචිය (600-999 දක්වා උපලේඛනය) | **2 වෙළුම හා 3 වෙළුම**<br>7 උපලේඛන (000-999 දක්වා) |
| **4 වෙළුම**<br>**K** : සාපේක්ෂ අනුක්‍රමණිකාව | **4 වෙළුම**<br>1 සාපේක්ෂ අනුක්‍රමණිකාව<br>2 නියමුව හෙවත් අත්පොත |

DDC 22 වන සංස්කරණය පිළිබඳව විමසා බැලීමේ දී එහි වෙළුම් හතරෙහිම අනුමාතෘකා A,B,C,D,E,F,G,H,I,J,K ලෙස නම් කර ඇති නමුත් 23 වන සංස්කරණය පළමු වෙළුම තුළ 1,2,3,4,5,6 යනුවෙන් අනුමාතෘකා හයක් ද දෙවන හා තෙවන වෙළුම් දෙකෙන්ම උපලේඛනය නියෝජනය වන හෙයින් එම වෙළුම් දෙකම

අංක 07 යටතේ ද විස්තර කොට ඇත. 22 වන සංස්කරණයේ පළමු වෙළුම තුළ දක්නට ලැබෙන අත්පොත 23 වන සංස්කරණයේ දක්නට ලැබෙන්නේ 4 වන වෙළුම තුළය.

**නව දත්ත නිරූපණයඃ**

DDC 22 සංස්කරණයට සාපේක්ෂව 23 වන සංස්කරණයේ දී නව සංස්කරණ සහායක දත්ත පද්ධති අනුගමනය කරමින් දත්ත බෙදා හැරීමේ ආකෘතියක් හඳුන්වා දී ඇත. Proprietary Format එක MARCXML යන නවීන ආකෘතියට පරිවර්තනය කරමින් 23 වන සංස්කරණය වඩාත් ඵලදායී අයුරින් පරිශීලකයන්ට ලබාදීමට සංස්කාරක මණ්ඩලය කටයුතු කොට ඇත.

**ස්ථානීය වෙනස්කම්ඃ**

ඩිවී දශම වර්ගීකරණයේ 22 වන සංස්කරණයට සාපේක්ෂව 23 වන සංස්කරණයෙහි වර්ග අංක සංග්‍රහ කෙරෙන ස්ථාන ද වෙනස් වී ඇති බවක් දැකගත හැකිය. එම ස්ථානීය වෙනස්කම් ආකාර 2ක් යටතේ හඳුනාගත හැකිය. පළමු වන ආකාරය නම් ද්විත්ව ශීර්ෂ ක්‍රමය (Dual Headings) ඉවත් කිරීමයි. ද්විත්ව ශීර්ෂ යනු දෘඩ අවකාශ 4ක් සහිත ශීර්ෂයන්ය. 23 වන සංස්කරණයේ දී විෂය පද දෙකකින් යුත් ශීර්ෂ (Dual Headings) ඉවත්කර එක් විෂය ශීර්ෂ පදයකට එක් අංකයක් බැගින් සංග්‍රහ කොට ඇත.

උදාහරණඃ 22 වන සංස්කරණයේ "Life Sciences & Biology - 570" යනුවෙන් විෂය පද දෙකක් එකම ශීර්ෂයක් යටතේ දක්වා ඇති නමුත්, 23 වන සංස්කරණයේ දී Biology - 570 යටතේ ද Life Sciences - 570 යටතේම සටහනක් සහිතව වෙනම ද ඉදිරිපත් කර ඇත.

දෙවන ආකාරය නම් උපලේඛන සහ චක්‍රවල සමබර බව ඇති කිරීමට කටයුතු යොදා තිබීමයි. මෙම දත්ත සහ සංඛ්‍යා පරාසයන් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට අමතර උපදෙස් ලබාදීමට භාවිත කරනු ලබයි.

උදාහරණඃ 305.805 - .89 (විශේෂිත ජනවාර්ගික හා ජාතික කණ්ඩායම්) යන තනි වශයෙන් පැවැති අංකය වෙනුවට 305.805-.809 සහ 305.81-.89

*Journal of Sri Lanka Library Review, Volume 38, Issue 2, June 2024, 31-49*
*DOI: https://doi.org/10.4038/sllr.v38i2.71*

ලෙස ස්ථාන දෙකක් සඳහා යොමු කර ඇත්තේ ඒ ඒ අවස්ථාවට උචිත ආකාරයෙන් අංක සාදා ගැනීමේ පහසුව සඳහා වේ.

**ආදේශනීය වෙනස්කම්:**

22 සංස්කරණයේ පැවති "පුද්ගලයින්" යන පදය වෙනුවට නව ආදේශ තුනක් ඇතුළත් කර ඇත. එනම්,

| | | |
|---|---|---|
| පුද්ගලයා | - | නෛතික සංකල්පය |
| පුද්ගලයින් | - | තනි පුද්ගලයින් |
| පුද්ගල කණ්ඩායම් | - | ජනතාව |

යනුවෙනි. මෙම පද භාවිත කිරීමේ දී සිදුවන අපැහැදිලි බව මග හරවා ගැනීමට සහ පාරිභාෂික වශයෙන් සුදුසු ස්ථානයේ දී යෙදීමට අවශ්‍ය උපදෙස් විස්තර සහිතව අනුක්‍රමණිකාව තුළ (Relative Index) අන්තර්ගත කර ඇත. එමෙන්ම ජන කණ්ඩායම්වල ඉදිරිපත් කිරීම ද වෙනස් වී ඇත.

| 22 සංස්කරණය | 23 සංස්කරණය |
|---|---|
| **T 1 – 08 "Kinds of Persons"** | **T 1 – 08 "Groups of People"** |
| **305 – Group of People** | **305 – Social Groups** යනුවෙන් |

පළමු වන වගුවෙහි -08 අංකයට අදාළව තිබූ පුද්ගල වර්ග යන පදය වෙනුවට ජන කණ්ඩායම් (Replaced "Kinds of Persons" with "Groups of People" ) යන්න ආදේශ කොට ඇති බව ද, එම වගුවෙහිම -092 අංකයට අදාළ වූ ශීර්ෂ පාඨය චරිතාපදාන (Biography) යන නමින් වෙනස්කොට ඇති බව ද, එම වගුවෙහිම -09 අංකයට අදාළව තිබූ "ඓතිහාසික, භූගෝලීය, පුද්ගල විස්තර" යන්න වෙනුවට " ඉතිහාසය, භූගෝලීය පිරියම්, චරිත (now "History, geographic treatment, biography" instead of "Historical, 2 geographic, persons treatment") ලෙස ආදේශ කොට ඇති බව ද දැක ගත හැකිය.

**චක්‍ර නොහොත් වගු යාවත්කාලීන කිරීම:**

ඩිවි දශම වර්ගීකරණයේ උපලේඛනවල සඳහන් අංක ව්‍යාප්ත කිරීමට සහ ප්‍රසාරණය කිරීමට උපකාරී වන අංකනයන් සහායක වගුවල දක්නට ලැබේ. 22 වන සංස්කරණයට සාපේක්ෂව 23 සංස්කරණයේ දී චක්‍ර නොහොත් වගු තුළ නව වැඩි

*Journal of Sri Lanka Library Review, Volume 38, Issue 2, June 2024, 31-49*
*DOI: https://doi.org/10.4038/sllr.v38i2.71*

දියුණු කිරීම්, නව අංක එකතුවීම්, පුළුල් වීම් සහ සංශෝධන දක්නට ලැබේ. 23 සංස්කරණයේ පළමු චක්‍රයේ වෙනස්කම් සහිත තැන්හි "Notation X from Table 1 as Modified Below" යනුවෙන් එය මෙසේ දක්වනු ලබයි. 401.4 (Communication¦ semantics" pragmatics" languages for special purposes (Notation 014 from Table 1 as modified below) (Similar entry also appears under T4—014). තවද 23 වන සංස්කරණය තුළ 22 වන සංස්කරණයෙහි පැවති වරදක් නිවැරදි කර ඇත. 22 වන සංස්කරණයේ ප්‍රමිත උපබෙදුම් යටතේ පළමු චක්‍රය තුළ පැවති -08, -0901-0905, -093 අංක 23 වන සංස්කරණයේ දී එම උපබෙදුම් විශේෂිත වශයෙන් දක්වා අදාළ තන්හි දී පමණක් යොදා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

**උපලේඛනය යාවත්කාලීන කිරීම:**

ඩිවි දශම වර්ගීකරණයේ 22 වන සංස්කරණයේ උපලේඛනයට සාපේක්ෂව 23 වන සංස්කරණයේ උපලේඛනය වඩාත් සංවර්ධිත ස්වරූපයක් පෙන්වනු ලබයි. වෙනස්වන අවශ්‍යතාවට අනුකූලව නව විෂය ශික්ෂණ සඳහා ඉඩ ලබාදීම, නව අංක එකතු කිරීම, ප්‍රසාරණය කිරීම හා සංස්කරණය කිරීම ආදි වශයෙන් නව වෙනස්කම් රැසක් සහිතව ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම අවස්ථා කිහිපයක් පහත වගු දෙක ඇසුරෙන් සංසන්දනාත්මකව විශ්ලේෂණය කෙරේ (Mitchell, 2011).

**වගු අංක 03 : චක්‍ර යාවත්කාලීන කිරීම**

| **චක්‍රය** | **නව අංක** | **පුළුල් කිරීම්** | **සංශෝධිත සහ පුළුල් කිරීම්** |
|---|---|---|---|
| පළමුවන චක්‍රය | —0141<br>Discourse analysis | —0286<br>Green technology (Environmental technology) | —072<br>Research |
| දෙවන චක්‍රය | —368 Scandinavia to 481 New number; relocated from —363 | —494 Switzerland<br>—4961 Turkey in Europe (Eastern Thrace)<br>—562–566Turkey Expanded | —486–488 Sweden<br>—4897 Finland |
| තෙවන චක්‍රය | —3082 Autobiographical and biographical fiction (TABLE 3B) | | —3 Arts and literature dealing with specific themes and subjects (TABLE 3C) |

| | | | |
|---|---|---|---|
| සිව්වන චක්‍රය | —0188<br>Corpus linguistics<br>—823 Punctuation | | —014 Communication; semantics, pragmatics, languages for special purposes |
| පස්වන චක්‍රය | —91829 Montenegrins<br>—9517 Hakka | —9922 Malayo-Polynesian languages of Indonesia, Malaysia, Singapore, Brunei, East Timor; Chamic languages | —914 South Asians<br>—9838 Tupí languages |
| හයවන චක්‍රය | —699 Galician<br>—91489Divehi (Maldivian) | —599 Rhaetian languages; Sardinian, Corsican<br>—935 Cushitic and Omotic peoples | —9838 Tupí languages |

**වගු අංක 04: උපලේඛනය යාවත්කාලීන කිරීම**

| Class | 22nd Edition of DDC | 23rd Edition of DDC |
|---|---|---|
| 000 | 011 - Bibliographies | 011 – Bibliographies and Catalogues |
| | 015 – Bibliographies of work from specific places | 015 – Work specific places |
| | 016 – Bibliographies of work from specific subjects | 015 –Work specific subjects |
| | 017 – General Subject Catalogs | 017 –of works held in specific collection or offered for sale |
| | 021 – Libraries Relationships | 021 – relationships of libraries and archives |
| | 051 – Serials in American English | 051 – General Serial publications in American English |
| | 052 – Serials in English | 052 – General Serial publications in English |
| | 057 – Serials in Slavic languages | 057 - General Serial publications in Slavic Languages |
| | 065 – Organization in Italy and Adjacent Island | 065 – General serial publications in Italy |
| | 070 – News Media, journalism & Publishing | 070 – Documentary, Educational, News Media, journalism |
| | 071 – News Paper in North America | 071 – Journalism & News Paper in North America |
| 100 | 108 – Kinds of persons treatment | 108 – Group of People |

| | | |
|---|---|---|
| | 109 – Historical & collected persons treatment | 109 – History and collected biography |
| | 149 – Other philosophical systems | 149 – Other philosophical systems and doctrines |
| | 197 – Philosophy of former Soviet Union | 197 – Philosophy of Russia |
| | 198 – Philosophy of Scandinavia | 198 – Philosophy of Scandinavia and Finland. |
| **200** | 250 – Christian Orders and Local Church | 250 – Local Christian church and religions orders |
| | 254 – Paris administration | 254 – Local Christian church administration |
| | 270 – History of Christianity and Christian church | 270- History, geographic treatment, biography |
| | 280 – Christian denominations & sects | 280 – Denominations & sects of Christian church |
| **300** | 305 – Social Groups | 305 – Group of People |
| | 356 – Industry force & warfare | 356 – Foot force & warfare |
| **400** | 440 – Romance Language; French | 440 – French and related Romance Language |
| | 441 – French Writing System & phonology | 441 - Writing System, phonology, Phonetics |
| | 442 – French Etymology | 442 – Etymology of Standard French |
| | 443 – French Dictionaries | 443 – Dictionaries of Standard French |
| | 449 – Occitan and Catalan | 449 – Occitan, Catalan, Franco-Provencal |
| | 451 – Italian Writings Systems & phonology | 451 – Writing Systems phonology, phonetics |
| | 471 – Classical Latin Writing & phonology | 471 – Writing systems phonology, phonetics |
| **500** | 570 – Life Science; Biology | 570 – Biology |
| | 583 – Dicotyledons | 583 – Eudicots and Ceratophyllales |
| | 584 – Monocotyledons | 584 – Monocots, Chloranthales, magnoliids |
| | 585 – Gymnosperms; conifers | 585 – Pinophyte |
| | 586 – Seedless plants. | 586 – Cryptogamian |
| | 587 – Capsular seedless plants | 587 – pteridophyte |
| | 591 – Specific topics in natural history | 591 – Specific topics in natural of animals |
| | 598 – Birds | 598 – Aves |
| **600** | 604 – Special topics | 604 – Technical drawing, hazardous materials |
| | 608 – Inventions | 608 – Patents |
| | 649 – Child rearing & home care of persons | 649 – Child rearing & home care of people |

| | | |
|---|---|---|
| | 661 – Industrial Chemicals | 661 – Technology of Industrial Chemicals |
| | 690 – Buildings | 690 – Construction of Buildings |
| | 694 – Wood construction & carpentry | 694 – Wood constructions |
| **700** | 710 – Civic & Landscape Art | 710 – Area planning and landscape architecture |
| | 740 – Drawing and Decorative Arts | 740 – Graphic arts, Decorative Arts |
| | 760 – Graphic Arts; Printmaking and Prints | 760 – Printmaking and Prints |
| | 775 – Digital Photography | 775 – (Unassigned) |
| | 777 - (Unassigned) | 777 – Cinematography and videography |
| **800** | 870–Italic Literatures; Latin Literatures | 870 – Latin & related Italic Literatures |
| **900** | 912 – Atlases, Maps, Charts & plans | 912 – Maps & plans of surface of earth |
| | 948 – Scandinavia | 948 – Scandinavia and Finland |

**වගු අංක 05 : උපලේඛනයෙහි නව අංක හා නව සංශෝධන**

| වර්ග පංතිය | | පුළුල් කිරීම් | සංශෝධිත සහ පුළුල් කිරීම් |
|---|---|---|---|
| 000 099 | 003.72 Networks<br>004.167 Handheld computing devices<br>004.6782 Cloud computing<br>025.042 World Wide Web | | 005.74 Data files and databases<br>004.65 Communications network architecture |
| 100 – 199 | 150.1985 Personal constructpsychology<br>150.1988 Positive psychology<br>160.119 Specific systems of classical and nonclassical logic | | 155 Differential and developmental psychology |
| 200 – 299 | 296.76 [Religious experience, life, practice in Judaism for] Persons experiencing illness, trouble, bereavement<br>297.125 Hadith (Traditions) [of Islam] | 262.94 Codex iruiscanonici (1983)<br>281.5 Eastern churches | 281.94-.99 Specific autocephalous, arbitrary autocephalous, autonomous, independent [Orthodox] churches |

| | | | |
|---|---|---|---|
| 300 – 399 | 302.343 Bullying<br>332.04246 Emigrant remittances<br>340.114 Justice<br>393.93 Funerals | 341.2422 European Union<br>345.01 Criminal courts<br>365.66 Services to prisoners | 324.2436 Parties of Austria<br>324.245 Parties of Italy<br>324.2494 Parties of Switzerland |
| 400 – 499 | 401.45 Pragmatics<br>401.95 Speech perception<br>413.17 Picture dictionaries<br>418.07 Multilingual phrase books | 459.9 Rhaetian languages; Sardinian, Corsican | 427.942 Geographic variations [of English] in England and Wales<br>447.944 Geographic variations[ofFrench] inFranceand Monaco |
| 500 – 599 | 511.314 Modal logic<br>511.317 Conditional logic<br>511.318 Probabilistic logic<br>551.417Wetland geomorphology | 519.62 Stochastic optimization<br>590.723 [Zoological] Descriptive research | 591.39Age characteristics [of animals] |
| 600 – 699 | 613.2622 Vegan diet<br>615.8514 Biofeedback therapy<br>623.8282 Fishing boats<br>684.162 [Manufacture of] Shelving | 616.462Diabetes mellitus<br>616.57 Parasitic and fungal skin diseases<br>613.283 [Dietetics of] Carbohydrates | 646.4 Clothing and accessories construction<br>636.294[Animal husbandryof] Cervidae (Deer) |
| 700 – 799 | 709.04058 Minimalism<br>781.648 Electronica<br>796.327 Team handball<br>796.8157 Taekwondo | 709.04075 Conceptual art<br>709.05 21st century, 2000–2099<br>796.62 Bicycle racing | |
| 800 – 899 | 808.025 Plagiarism<br>869.9Galician literature<br>891.496Pahari literatures | 859.9 Literatures of Rhaetian, Sardinian, Corsican languages | |
| 900 – 999 | | 909.83 21st century, 2000–2099 | 930 History of ancient world to ca. 499<br>945 Italy, San Marino, Vatican City, Malta<br>959.7 Vietnam |

**සමාලෝචනය**

මෙල්විල් ඩිවී සිය උසස් අධ්‍යාපනය සඳහා ඇම්හර්ට්ස් විද්‍යාලයට ඇතුළත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉදිරිපත් කළ නිබන්ධනයෙන් ආරම්භ වූ මූලික සිද්ධාන්තයන් පදනම් කරගෙන 1876 දී "A classification and subject Index for Cataloguing and Arranging the Books and Pamphlets of a Library" නම් වර්ගීකරණ පද්ධතිය හඳුන්වා දෙන ලදි. පසුව විවිධ සංවර්ධිත අවස්ථාවන් හමුවේ එය "ඩිවී දශම වර්ගීකරණය" නමින් හඳුන්වා ඇත. ඩිවී දශම වර්ගීකරණයේ 22 වන සංස්කරණයට සාපේක්ෂව 23 වන සංස්කරණයේ උපලේඛනය සහ චක්‍ර යාවත්කාලින කිරීම්, ව්‍යුහගත වෙනස්කම්, පුද්ගල තේමාව වෙනස්වීම සහ දත්ත නිරූපණ ක්‍රමවේදය වෙනස් වීම් ආදි වශයෙන් වෙනස්කම් රාශියක් සිදුව ඇත. එහි දී නව විෂය අංක ලබාදීම්, පුළුල් වීම්, සංශෝධනය වීම් සහ ස්ථානගත වෙනස්වීම් ආදිය මෙන්ම යාවත්කාලීන කිරීම් ද සිදු කොට ඇත. ප්‍රායෝගික වර්ගීකරණ ක්‍රමයක් ලෙස පරිණාමය වීමට ඩිවී දශම වර්ගිකරණයට ඇති ශක්‍යතාව එහි සජීවීබවට හා අඛණ්ඩ පැවැත්මට පදනම වී ඇත. විශ්ව දැනුම ප්‍රසාරණයට, දැනුම සංවිධානයට සහ තාක්ෂණික සංවර්ධනයට සමගාමීව ඩිවී දශම වර්ගීකරණ ක්‍රමයේ වෙනස්කම් සිදුවෙමින් පවතී. ඩිවී දශම වර්ගීකරණයට අවේනික දුර්වලතා සහ ව්‍යුහමය සීමා සහිතකම් එහි සාර්ථකත්වයට බලපෑම් කරනු ලබයි. එබඳු ඇතැම් දුර්වලතා පැවතිය ද ඩිවී දශම වර්ගීකරණයෙහි එක් විශේෂත්වයක් වනුයේ එකී ගැටලු විසඳා ගනිමින් ප්‍රායෝගික වර්ගීකරණ ක්‍රමයක් ලෙස ප්‍රවර්ධනය වීමට ඇති හැකියාව තත්කාලීන සංස්කරණ අධ්‍යයනය කිරීමෙන් මනාව පැහැදිලි වේ. පුස්තකාලය වර්ගීකරණය මෑත කාලයේ බොහෝ වැඩිදියුණු තත්ත්වයට පත්ව ඇති අතර ඩිවී දශම වර්ගීකරණය නූතනයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අනුකූලව සංස්කරණය වෙමින් පවතියි.

**විමර්ශන**

තිස්ස, ආර්. ඩී. ආනන්ද, (2019), ***පුස්තකාල ග්‍රන්ථ වර්ගීකරණ අත්පොත : ඩිවී, විශ්ව හා දෙතිත් වර්ගීකරණ සංකල්ප භාවිතය හා පරිචය***, නුගේගොඩ : නැණිල පබ්ලිකේෂන් ප්‍රයිවෙට් ලිමිටඩ්, 2019, පි. 10

රණසිංහ, පියදාස, (2011). ***ඩිවී දශම වර්ගීකරණයේ න්‍යාය හා භාවිතය.*** රාගම: පියදාස රණසිංහ.

*Journal of Sri Lanka Library Review, Volume 38, Issue 2, June 2024, 31-49*
*DOI: https://doi.org/10.4038/sllr.v38i2.71*

වීරසූරිය, ඩබ්. ඒ. (2014). ***පුස්තකාල වර්ගීකරණයක තිබිය යුතු සාධක සහ ගුණ ලක්ෂණ පිළිබඳ විග්‍රහයක්.*** *කෘතවේදී : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ අභිනන්දන ග්‍රන්ථය,* 165-172.

සෝරත හිමි, වැලිවිටියේ. (2011). ***ශ්‍රී සුමංගල ශබ්දකෝෂය.*** කොළඹ: ගොඩගේ.

Harrison, C. T. & Beenham, R., (1985). ***The basics of librarianship***. London: Bingley. https://www.oclc.org/content/dam/oclc/dewey/versions/print/new_features.pdf

Sayers, W. C. B. (1922). *An introduction to library classification, theoretical, historical, and practical, and A short course in practical classification, with readings, questions and examination papers*. Retrieved from http://archive.org/details/introductiontoli00sayerich

අලහකෝන්, උදිත. (2014). ***ඩිවී දශම වර්ගීකරණය : ප්‍රයෝගික ප්‍රවේශයක්.*** කොළඹ : ගොඩගේ

අලහකෝන්, උදිත. (2017). ***DDC** 23 **: ඩිවී දශම වර්ගීකරණය** 23 **සංස්කරණය.*** ගම්පහ : නයින් පබ්ලිෂින්

පද්මසිරි, පී. ආර්. (2006). ***පුස්තකාල වර්ගීකරණය.*** ඒකල : කර්තෘ.

Library classification. (n.d.). *In Encyclopedia Britannica*. Retrieved November 12, 2019, from https://www.britannica.com

Mitchell, J. S. (2011). *DDC 23: An Overview*. Retrieved September 30, 2015, from http://webcache.googleusercontent.com/search?q=cache:wtN1SScPqXcJ:www.univie.ac.at/voeb/fileadmin/Dateien/Kommissionen/Sacherschliessung/DDC23Overview